# ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසල් මට්ටමේ ළමුන්ගේ ස්ව-සංකල්පය මැනීම සඳහා මිනුම් උපකරණයක් ගොඩනැගීම හා සම්මතකරණය

වත්තිගමගේ චන්ද්‍රදාස

අධ්‍යාපන දර්ශනපති උපාධියේ අවශ්‍යතා පූර්ණය කිරීම සඳහා ඉදිරිපත්කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනයකි

UCLIB
454941

අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්වවිද්‍යාලය,
කොළඹ 03
1996 ජනවාරි

CR
Library Sri Lanka

# සංක්ෂිප්තය

ස්ව-සංකල්පය මෑතක සිට මනෝවිද්‍යාඥයින් හා සමාජ විද්‍යාඥයින්ගේ අවධානයට ලක්වී ඇති වැදගත් සංරචකයකි. මෙම සංරචකය සඳහා වඩාත් වලංගු අර්ථකථනයක් සැපයීමත් එම අර්ථකථනය පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසල් මට්ටමේ ළමුන්ගේ ස්ව-සංකල්පය මැනීම සඳහා මිනුම් උපකරණයක් ගොඩනැගීම හා සම්මතකරණයත් අද්‍යතන පර්යේෂණයේ මූලික අරමුණවිය.

මෙම පර්යේෂණයේදී ප්‍රථමයෙන්ම පර්යේෂණ සාහිත්‍ය පරිශීලනය මගින් ස්ව-සංකල්පය පිළිබඳ අර්ථකථනයක් සපයා ඇත. මෙම අර්ථකථනයට අනුව ස්ව-සංකල්පය යනු පුද්ගලයා තමා සංජානනය කරගෙන ඇති ආකාරයයි. මෙහි ඇගයුම් ස්වභාවයක්ද ඇත. පුද්ගලයාගේ ස්ව-සංකල්පය මූලික පරිමාණ තුනකින් සකස් වී ඇත. හැකියාවන්, කායික ස්වභාවය, හා සමාජ පිළිගැනුම ඊට ඇතුළත් වේ. මේවා නැවත අතුරු පරිමාණයන්ට බෙදීයන අතර ධූරාවලියක ආකාරයට සංවිධානය වේ. ස්ව-සංකල්පයේ මීළඟ වැදගත් ලක්ෂණය වන්නේ එය පුද්ගලයාගේ චර්යාව සමග පවත්නා සෘජු සම්බන්ධතාවයි.

මිනුම් උපකරණය ගොඩනැගීම හා සම්මතකරණය සඳහා කරනලද අධ්‍යයනවලට ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසල් මට්ටමට අයත් සිසු නියැදීන් යොදාගන්නා ලදී. කෙසේ වෙතත් මෙහිදී ඉලක්ක ජනගහනය ලෙස සලකා ඇත්තේ ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ප්‍රදේශ හැර ඉතිරි ප්‍රදේශවල සිංහල මාධ්‍යයෙන් ඉගෙනුම ලබන ද්විතීයික පාසල් මට්ටමට අයත් ළමුන්වේ. ඔවුන්ගෙන් නියැදීන් සඳහා සිසුන් තෝරාගැනීමට ස්ථරගත හා අහඹු ක්‍රමය යොදාගන්නා ලදී.

අද්‍යතන ස්ව-සංකල්ප මිනුම් උපකරණය ලයිකට් පරිමාණ ක්‍රමයට ගොඩනගනලදි. මිනුම් උපකරණය ගොඩනැගීමේදී ප්‍රථමයෙන් ද්විතීයික පාසල් මට්ටමේ ළමුන් ඔවුන් සම්බන්ධව වැදගත්කොට සලකනු ලබන කරුණු හඳුනාගැනීම සඳහා අධ්‍යයනයක් කර ඇත. මිනුම් උපකරණයට ඇතුළත්කළයුතු උපපරිමාණ හඳුනාගැනීම සඳහා මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල භාවිතකරන ලදී.

Library
Sri Lanka

දෙවැනිව මිනුම් උපකරණයට ඇතුළත් කළයුතු පරීක්ෂණාංග ගොඩනගනු ලැබීය. මෙසේ ගොඩනගනු ලැබූ පරීක්ෂණාංග ඇතුළත්කර සකස්කරන ලද මිනුම් උපකරණය නියාමක පරීක්ෂණ දෙකක් මගින් සංස්කරණය කර ඇත. ප්‍රථම නියාමක පරීක්ෂණය මගින් පරීක්ෂණාංග තාර්කික විශ්ලේෂණයකට ලක්කර අඩුපාඩු සහිත පරීක්ෂණාංග ඉවත්කර ඇත, දෙවැනි නියාමක පරීක්ෂණනය මගින් පරීක්ෂණාංග සංඛ්‍යා විද්‍යාත්මක විශ්ලේෂණයකට ලක්කර වලංගුතාව අඩු පරීක්ෂණාංග ඉවත්කර ඇත. මෙසේ සංස්කරණය කරන ලද මිනුම් උපකරණයේ අවසාන පිටපත පරීක්ෂණාංග 80 කින් යුක්ත වේ.

මිනුම් උපකරණයට අදාළ ප්‍රතිමාන, විශ්වසනීයතාව, හා වලංගුතාව පිළිබඳ තොරතුරු සැපයීම සඳහා අවශ්‍ය අධ්‍යයනයක් සිදුකර ඇත. ඒ අනුව ප්‍රතිමාන යටතේ මිනුම් උපකරණය මගින් ලබාගන්නා දළ ලකුණු අර්ථකථනය සඳහා භාවිතා කළ හැකි පරිදි ප්‍රතිශතක තරා සහ T ලකුණු සපයා ඇත. විශ්වසනීයතාව යටතේ මිනුම් උපකරණයේ ස්ථායීතාව හා අභ්‍යන්තර සංගතතාව තක්සේරුකර ඇත. ඒ අනුව මුළු පරිමාණය සඳහා ස්ථායීතා සංගුණකය .81 ක් වූ අතර උපපරිමාණයන් සඳහා එය .60 ක් .91 ත් අතර විය. අභ්‍යන්තර සංගතතාව පිළිබඳ කරන ලද පරීක්ෂණ ප්‍රතිඵල අනුව මුළු පරිමාණය සඳහා $\alpha$ සංගුණකය .91 ක් වූ අතර උපපරිමාණයන් සඳහා එය .67 ත් .89 ත් අතර විය. වලංගුතාව තක්සේරුකිරීම සඳහා අධ්‍යයන දෙකක් සිදුකර ඇත. පළමු අධ්‍යයනයේදී පාසල් කාර්ය සාධනය හා ස්ව-සංකල්පය අතර සම්බන්ධතාව පරීක්ෂාකරනලදි. දෙවැනි අධ්‍යයනයේදී අද්‍යතන ස්ව-සංකල්ප මිනුම් උපකරණය මගින් ලබාගන්නා මිනුම් හා වෙනත් වලංගු ස්ව-සංකල්ප මිනුම් උපකරණයක් මගින් ලබාගන්නා මිනුම් අතර සහසම්බන්ධතාව පරීක්ෂාකරන ලදී. පරීක්ෂණ දෙකෙන්ම විචල්‍යයන් අතර අපේක්ෂිත සම්බන්ධතාව තහවුරුකරන සාක්ෂි ලැබුනි.

විශ්වසනීයතාව හා වලංගුතාව පිළිබඳ කරන ලද පරීක්ෂණ ප්‍රතිඵල අනුව අද්‍යතන ස්ව-සංකල්ප මිනුම් උපකරණය ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසල් මට්ටමේ ළමුන්ගේ ස්ව-සංකල්පය මැනීම සඳහා ප්‍රමාණවත් වලංගුතාවකින් හා විශ්වසනීයතාවකින් යුත් මිනුම් උපකරණයක් බව පැහැදිලි විය. මේ අනුව පර්යේෂණ කාර්යයන් ප්‍රතිකාරාත්මක වැඩ සටහන් ආදියේදී ස්ව-සංකල්පය මැනීම සඳහා යෝග්‍ය මිනුම් උපකරණයක් ලෙස මෙම මිනුම් උපකරණය සැලකිය හැකිය.